(නවවැනි පාර්ලිමේන්තුව - සිව්වැනි සභාවාරය)

අංක 1(2).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2023 පෙබරවාරි 21 අඟහරුවාදා**

---

**2023 මාර්තු 07 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1/2023

ගරු චමින්ද විජේසිරි මහතා,— මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය "යහපාලන රජය" පැවති අවදියේ ශ්‍රී ලංකා මහ බැංකුවේ බැඳුම්කර වංචාව සිදු වන අවස්ථාවේදී ශ්‍රී ලංකා මහ බැංකුව අයත්ව තිබූ අමාත්‍යාංශය කවරේද;

(ii) එම අවස්ථාවේදී ඉහත සඳහන් අමාත්‍යාංශය භාරව සිටි අමාත්‍යවරයාගේ නම සහ අමාත්‍යාංශ ලේකම්වරයාගේ නම වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම බැඳුම්කර වංචාව සම්බන්ධයෙන් මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

378/2023

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ස්ථාපිත කර ඇති රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල ඉගෙනුම ලබන සිසුන් සංඛ්‍යාව කොපමණද;

(iii) ශ්‍රී ලංකාවේ පාසල්, වර්ගීකරණය කර ඇති පදනම කවරේද;

(iv) ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපනයේ විෂමතාවයක් පවතින බව පිළිගන්නේද;

(v) එම විෂමතාවය ඉවත් කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2021 වර්ෂයේ පහ ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය සමත් වූ සිසුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව, විභාගයට පෙනී සිටි මුළු සිසුන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(iii) විභාගය සමත් වී ජනප්‍රිය පාසල්වලට ඇතුළත් වූ සිසුන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම සංඛ්‍යාව, විභාගයට පෙනී සිටි මුළු සිසුන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

416/2023

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා පොලීසිය සතු නිල සුනඛයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පොලිස් නිල සුනඛයන්ගේ වර්ග කවරේද;

(iii) එම එක් එක් වර්ගය අනුව නිල සුනඛයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පොලිස් නිල සුනඛ කොට්ඨාසයට අනුයුක්ත කර ඇති නිලධාරීන් සංඛ්‍යාව;

(ii) වර්ෂ 2017 සිට 2021 දක්වා පොලිස් නිල සුනඛයන්ගේ ආධාරයෙන් අනාවරණය කරගන්නා ලද අපරාධ සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන්;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

442/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර, වේරදුව බණ්ඩාරනායක විදුහලේ ක්‍රීඩාංගනය, ප්‍රදේශයේ ක්‍රීඩකයන් පුහුණුවීම් සඳහා භාවිතා කරන ලද බවත්;

(ii) එම භූමිය ව්‍යාපාර කටයුත්තක් සඳහා ලබා දීමට හිටපු ප්‍රාදේශීය ලේකම්වරිය විසින් කටයුතු කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත භූමිය ලබා දීමේදී ටෙන්ඩර් කැඳවා තිබේද;

(ii) එසේ නම්, එම ටෙන්ඩර් කැඳවන ලද දිනය කවරේද;

(iii) ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද එක් එක් පුද්ගලයාගේ නම සහ ටෙන්ඩරයේ වටිනාකම වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ටෙන්ඩරය ලබා ගන්නා ලද පුද්ගලයාගේ/ආයතනයේ නම, ලිපිනය හා දුරකථන අංක වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත ක්‍රීඩාංගනය, ක්‍රීඩා කටයුතු සඳහා ප්‍රදේශයේ ජනතාවට නැවත ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

684/2023

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, කල්මුණේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා ගණකාධිකාරිවරයකු පත් කර තිබේද;

(ii) එම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා ගණකාධිකාරිවරයකු පත් කිරීම ප්‍රමාද වීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ එරාවුර්පත්තු, කලවන්චිකුඩි සහ පෝරතිවුපත්තු යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුනෙහි ජනගහනය අධික බැවින් එම එක් එක් කොට්ඨාසය කොටස් දෙකකට බෙදීම සඳහා මේ වනවිට පියවර ගෙන තිබේද;

(ii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(iii) මේ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

814/2023

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවට අවශ්‍ය බිත්තර සංඛ්‍යාව දෛනිකව හා වාර්ෂිකව;

(ii) මේ වනවිට ශ්‍රී ලංකාවේ නිෂ්පාදන කරනු ලබන බිත්තර සංඛ්‍යාව, දෛනිකව, මාසිකව හා වාර්ෂිකව;

(iii) මේ වනවිට ශ්‍රී ලංකාවේ බිත්තර හිඟයක් පවතින්නේ නම්, එම හිඟය දෛනිකව හා මාසිකව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) බිත්තර නිෂ්පාදන කර්මාන්තයේ නියැලී සිටින කුඩා, මධ්‍යම හා මහා පරිමාණයේ නිෂ්පාදකයන් සංඛ්‍යාව;

(ii) දෛනිකව බිත්තර 1000කට වැඩි, 10,000කට වැඩි හා 100,000කට වැඩි යන එක් එක් කාණ්ඩය යටතේ බිත්තර නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදකයන් සංඛ්‍යාව;

(iii) ඉහත (i)හි සඳහන් එක් එක් කාණ්ඩය යටතේ දිනකට නිෂ්පාදනය කරනු ලබන බිත්තර සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) බිත්තරයක් ආනයනය කිරීම සඳහා වැය වන මුදල කොපමණද;

(ii) පාරිභෝගිකයන් සඳහා එම ආනයනික බිත්තරයක් ලබා දිය හැකි මිල කොපමණද;

(iii) බිත්තර ඇතුළු ඇතැම් අත්‍යාවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය කූට ව්‍යාපාරිකයන් විසින් ඉහළ මිලකට විකුණන බව පිළිගන්නේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

831/2023

ගරු ඉම්තියාස් බාකීර් මාකර් මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 746-ඉදිරිලිගොඩ ග්‍රාම නිලධාරි වසමේ, පාසල් මාර්ගය කාපට් අතුරා සංවර්ධනය කිරීමේ මූලික කාර්යය බස්නාහිර පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ, කළුතර කාර්යාලය විසින් සිදු කරන ලද බවත්;

(ii) ඒ අනුව පළමු අදියර ලෙස ඉහත මාර්ගයේ කොන්ක්‍රීට් ගල් අතුරන ලද බවත්;

(iii) මේ වනවිට එම කොන්ක්‍රීට් ගල්, වර්ෂා ජලයට ගසාගෙන යාම හේතුවෙන් එම මාර්ගය අබලන් වී ගමනාගමනය සඳහා නුසුදුසු තත්ත්වයක පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත මාර්ගය කාපට් අතුරා සංවර්ධනය කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම කටයුතු ආරම්භ කරනු ලබන දිනය කවරේද;

(iii) ඉහත ව්‍යාපෘතිය සඳහා වෙන් කරන ලද මුදල කොපමණද;

(iv) ඉහත අ(iii) හි සඳහන් කරුණ හේතුවෙන් මුදල් අපතේ යාමක් සිදු වී තිබේ නම්, ඊට වගකිව යුතු පුද්ගලයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

832/2023

ගරු නිතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2022 වර්ෂයේදී කොළඹ දිස්ත්‍රික්කයෙන් හඳුනාගෙන ඇති ඩෙංගු රෝගීන් සංඛ්‍යාව එක් ප්‍රදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) කොළඹ දිස්ත්‍රික්කයේ ඩෙංගු රෝගය ව්‍යාප්ත වීම මැඩපැවැත්වීම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

847/2023

ගරු ගාමිණී වලේබොඩ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2021 වර්ෂයේදී පනවන ලද රසායනික පොහොර තහනම හේතුවෙන් ශ්‍රී ලංකාවට සිදු වූ ආර්ථික බලපෑම ගණනය කර තිබේද;

(ii) එසේ නම්, වී, තේ, රබර්, කුරුඳු , පොල්, සහ එළවළු ආදී එක් එක් භෝගයේ නිෂ්පාදනයේ සිදු වූ පහත වැටීම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) රසායනික පොහොර තහනම් කිරීම හේතුවෙන් ගොවීන් ගොවිතැන් කිරීමෙන් ඉවත් වී තිබේද;

(iv) එසේ නම්, එම ගොවීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

858/2023

ගරු නීතිඥ රාවුෆ් හකීම් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2019 – 2022 කාලය තුළ ආණ්ඩුව විසින් නියම කරන ලද කොවිඩ්-19 සඳහා වූ ඔඩ්ඩමාවඩි සුසාන භූමිය තුළ මිහිදන් කරන ලද කොවිඩ් 19 ආසාදිත මරණ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම සංඛ්‍යාව ඔවුන්ගේ වයස, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ජාතිය, ආගම සහ ජීවත් වූ පළාත/ දිස්ත්‍රික්කය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) කොවිඩ්-19 ආසාදිත මරණ සඳහා සුසාන භූමියක් වශයෙන් රජය විසින් ඔඩ්ඩමාවඩි තෝරාගත් පදනම කුමක්ද;

(iv) කොවිඩ්-19 ආසාදිත මරණ සඳහා සුසාන භූමියක් වශයෙන් ඔඩ්ඩමාවඩි යොදාගත් පදනම සහ නිර්ණායක යොදාගනිමින් ඔඩ්ඩමාවඩි හැර වෙනත් ස්ථානයක්/ස්ථාන තෝරාගැනීමට රජය විසින් යම් කිසි උත්සාහයක් දරන ලද්දේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහි ද?

(ආ) නොඑසේනම්, ඒ මන්ද?

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2023 මාර්තු 07 අඟහරුවාදා)**

846/2023

ගරු ගාමිණී වලේබොඩ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2016 සිට 2020 දක්වා එක් එක් වර්ෂයේ පවත්වන ලද 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රතිඵල අනුව තීරණය වූ කඩඉම් ලකුණු මත කොළඹ, ගම්පහ, මහනුවර, කුරුණෑගල, ගාල්ල, රත්නපුර සහ මාතර යන එක් එක් දිස්ත්‍රික්කයේ ඉහළම කඩඉම් ලකුණු තීරණය වූ පාසල් 5 සඳහා බඳවාගන්නා ලද සිසුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1296/2023

ගරු අලි සබ්රි රහීම් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විශ්‍රාම වැටුප් අංක 01-802666 හිමි එම්. නයිමුල්ලාහ් මහතාට, 2021.12.31 දිනැති සංශෝධිත විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍රයට අනුව හිමි විය යුතු මාසික විශ්‍රාම වැටුප රු. 31,833.33 ක් බව දන්නේද;

(ii) එසේ නම්, එම විශ්‍රාම වැටුප ඒ මහතාට අවසන් වරට ගෙවන ලද දිනය කවරේද;

(iii) එලෙස ගෙවා නොමැති නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් විසින් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් අමතන ලද අංක වි.වැ.ගි. 36/202 හා 2022.10.30 දිනැති ලිපියේ 3 වන ඡේදයේ සඳහන් පරිදි විශ්‍රාම වැටුප ලබා දීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග මේ වනතෙක් නොගැනීමට හේතු කවරේද;

(ii) හිඟ වැටුප් සහ දීමනා සමඟ ඉහත (අ) (i)හි සඳහන් විශ්‍රාම වැටුප නයිමුල්ලාහ් මහතාට ගෙවනු ලබන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2023 මාර්තු 08 බදාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

863/2023

ගරු රෝහණ බංඩාර මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2018 සිට මේ දක්වා සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයින්ගේ සමුපකාර සකසුරුවම් සහ ණයදෙන සමිතියෙන් ණය ලබා ගැනීම සඳහා අයදුම්පත් ඉදිරිපත්කර ඇති අයදුම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම අයදුම්කරුවන් අතරින් මේ දක්වා ණය ලබා දී ඇති අයදුම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත (i) හි සඳහන් අයදුම්කරුවන් අතරින් මේ දක්වා ණය ලබා නොදුන් අයදුම්කරුවන්ට කඩිනමින් ණය ලබා දීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1297/2023

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීමාසහිත ලංකා නැව් සංස්ථාව ස්ථාපිත කළ දිනය කවරේද;

(ii) එම සංස්ථාව ස්ථාපිත කිරීමේ අරමුණු කවරේද;

(iii) මේ වනවිට එම සංස්ථාවේ සේවයේ නියුතු සේවක සංඛ්‍යාව කොපමණද;

(iv) මේ වනවිට එම සංස්ථාව සතු නැව් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා එම සංස්ථාවේ ලාභය/අලාභය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) සීමාසහිත ලංකා නැව් සංස්ථාව ආර්ථික වශයෙන් ශක්තිමත් කිරීමට අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1302/2023

ගරු කිංස් නෙල්සන් මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) භාණ්ඩ ප්‍රවාහනය සඳහා මේ වනවිට යොදා තිබෙන දුම්රිය සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් දුම්රියේ ගමනාන්තය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) භාණ්ඩ ප්‍රවාහනය කිරීමට වැඩි වශයෙන් දුම්රිය යොදා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1307/2023

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට සිමෙන්ති කර්මාන්තශාලාව ඉදිකිරීම සඳහා ලබා දෙන ලද ඉඩමේ විශාලත්වය කොපමණද;

(ii) ඉහත කර්මාන්තශාලාව ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා වන ආයෝජනය කොපමණද;

(iii) ඉහත ව්‍යාපෘතිය සඳහා වූ ආයෝජන ගිවිසුමට එළැඹි දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1315/2023

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවට කුළුබඩු වර්ග ආනයනය කරන්නේද;

(ii) එසේ නම්, එම කුළුබඩු වර්ග කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කුළුබඩු වර්ගයේ වාර්ෂික අවශ්‍යතාවය සහ ආනයනය කරනු ලබන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ශ්‍රී ලංකාවේ වගා කරනු ලබන එක් එක් කුළුබඩු වර්ගයේ වාර්ෂික අස්වැන්න වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ආනයනය කරනු ලබන කුළුබඩු වර්ගවල දේශීය නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1320/2023

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඇලහැර-ගිරිතලය අභයභූමියේ විශාලත්වය අක්කරවලින් කොපමණද;

(ii) මේ වනවිට එම අභයභූමියට අයත් අක්කර 250ක් පමණ විශාලත්වයකින් යුත් ප්‍රදේශයක විශාල පරිසර හානියක් සිදු වී ඇති බව දන්නේද;

(iii) එසේ නම්, ඒ සම්බන්ධව අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1326/2023

ගරු ඉෂාක් රහුමාන් මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2019 වර්ෂයේ ශ්‍රී ලංකාවේ බඩඉරිඟු වගා කරන ලද බිම් ප්‍රමාණය;

(ii) වර්ෂ 2020/2021 මහ කන්නයේදී බඩඉරිඟු වගා කරන ලද බිම් ප්‍රමාණය;

(iii) එම කන්නයේ වගා කිරීම සඳහා භාවිත කරන ලද දේශීය බඩඉරිඟු බීජ ප්‍රමාණය සහ ආනයනික බීජ ප්‍රමාණය වෙන් වෙන් වශයෙන්;

(iv) දේශීය බඩඉරිඟු බීජ කිලෝග්‍රෑම් එකක සහ ආනයනික බීජ කිලෝග්‍රෑම් එකක මිල වෙන් වෙන් වශයෙන්;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අක්කර එකක බඩඉරිඟු වගාකිරීම සඳහා අවශ්‍ය බීජ ප්‍රමාණය;

(ii) එම බීජ සඳහා වැය වන මුදල;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1456/2023

ගරු මායාදුන්න චින්තක අමල් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිරි ගවයන් සඳහා තණකොළ නොමැතිවීම හේතුවෙන් ග්‍රාමීය ප්‍රදේශවල සුළු පරිමාණ කිරි ගොවීන් දැඩි අපහසුතාවයකට පත් වී ඇති බවත්;

(ii) පුන්නක්කු සහ කිරි ගව පාලනය සඳහා අවශ්‍ය අනෙකුත් ද්‍රව්‍යවල මිල අධික ලෙස ඉහළ යාම හේතුවෙන් ඒවා සපයා ගැනීමට අපහසු වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) කිරි ගොවීන් ආරක්ෂා කර ගැනීමට සහ කිරි ගවයන්ට අවශ්‍ය ආහාර සපයා ගැනීමට නිසි වැඩපිළිවෙළක් සකස් කර තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2023 මාර්තු 09 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2/2023

ගරු චමින්ද විජේසිරි මහතා,— මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 - 2019 "යහපාලන රජය" සමයේ ශ්‍රී ලංකා මහ බැංකු වංචාව සිදු වූ බව දන්නේද;

(ii) එම වංචාව හේතුවෙන් සිදු වී ඇති මූල්‍යමය අලාභය කොපමණද;

(iii) එම මුදල නැවත අයකර ගැනීමට අවශ්‍ය කටයුතු මේ වනවිට සිදු කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම වංචාවට සම්බන්ධ බවට චෝදනා එල්ලවී ඇති පුද්ගලයන්ගේ නම් කවරේද;

(ii) ඔවුන්ට එරෙහිව ගෙන ඇති නීතිමය ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

379/2023

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ වගා කර ඇති ෆයිනස් සහ ටර්පන්ටයින් ශාක හේතුවෙන් සිදු වන පාරිසරික විනාශය ගණනය කර තිබේද;

(ii) එම ශාක ඉවත් කිරීමට අදාළ වැඩසටහනේ මේ වනවිට ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ෆයිනස් සහ ටර්පන්ටයින් ශාක වගා කර ඇති රජයේ ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම්, පිහිටා ඇති ප්‍රදේශ කවරේද;

(iii) රජයේ ඉඩම්වල වගා කර ඇති ෆයිනස් සහ ටර්පන්ටයින් ශාක ඉවත් කර එම ඉඩම් වගාකිරීම සඳහා තරුණ වගාකරුවන්ට ලබාදීමට වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

417/2023

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ දියර කිරි නිෂ්පාදනය කරනු ලබන ප්‍රධාන දිස්ත්‍රික්ක කවරේද;

(ii) එම එක් එක් දිස්ත්‍රික්කයේ නිෂ්පාදනය කරනු ලබන දියර කිරි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මේ වනවිට ස්ථාපිත කර ඇති දියර කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iv) "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් පරිදි දියර කිරි නිෂ්පාදන ගබඩා කිරීමේ ධාරිතාවය ඉහළ නැංවීම සඳහා සූර්ය බලයෙන් ක්‍රියාත්මක කරනු ලබන කුඩා පරිමාණ කිරි ශීත කිරීමේ තාක්ෂණික ක්‍රමය මේ වනවිට හඳුන්වා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

473/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 වර්ෂයේ ජනවාරි මාසයේ සිට ක්‍රියාත්මක කරන ලද නව වැටුප් ව්‍යුහය හේතුවෙන් විශ්වවිද්‍යාල අනධ්‍යයන හා පරිපාලන සේවාවන්හි වැටුප් විෂමතාවයක් ඇති වූ බවත්;

(ii) මේ සම්බන්ධයෙන් අදාළ පාර්ශ්වයන් දිගින් දිගටම දැනුම්වත් කරන ලද නමුත් මේ දක්වා යහපත් ප්‍රතිචාරයක් නොලැබුණු බවත්;

(iii) මේ හේතුවෙන් ඉහත සේවාවල සේවය කරනු ලබන නිලධාරින්ට අසාධාරණයක් සිදු වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එසේ නම්, ඉහත සඳහන් වැටුප් විෂමතාවය ඉවත් කිරීමට ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

(iii) එම වැටුප් විෂමතාව ඉවත් කර, ඉහත නිධාරින්ට ගෙවිය යුතු සියලු ගෙවීම් ගෙවා අවසන් කිරීමට අපේක්ෂා කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

685/2023

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, මන්මූර් ප්‍රදේශයේ ඉදිවන ජල ටැංකියේ ඉදිකිරීම් කටයුතු ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට මුදල් නොගෙවීම හේතුවෙන් අත්හිටුවා ඇති බවත්;

(ii) ඒ හේතුවෙන්, දමන ප්‍රදේශයේ සිට ඍජුවම ජලය සපයනු ලබන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, දමන ප්‍රදේශයේ සිට ප්‍රධාන කොට්ඨාස හතරකට ජලය සැපයීම හේතුවෙන් ඇති වී තිබෙන දුෂ්කරතා කවරේද;

(ii) මේ වනවිට ජලය ලබා දීම සඳහා නල එළිය යුතු ගම්මාන සංඛ්‍යාව කොපමණද;

(iii) එම ගම්මානවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

815/2023

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මධ්‍යම රජයේ හා පළාත් සභා රෝහල් සංඛ්‍යාව එම රෝහල් වර්ගීකරණය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම රෝහල්වල දැඩි සත්කාර ඒකකවල ඇති ඇඳන් සංඛ්‍යාව හා සාමාන්‍ය වාට්ටුවල ඇති ඇඳන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත (i)හි රෝහල්වල සේවය කරන මුළු වෛද්‍යවරුන් සංඛ්‍යාව සහ එම සංඛ්‍යාව, විශේෂඥ වෛද්‍යවරුන් සහ සාමාන්‍ය වෛද්‍යවරුන් ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ රෝහල්වල භාවිතා කරනු ලබන ඖෂධ වර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඖෂධ වර්ග අතරින් මේ වනවිට හිඟ ඖෂධ වර්ග සංඛ්‍යාව කොපමණද;

(iii) ශ්‍රී ලංකාවට අවශ්‍ය ඖෂධ ආනයනය කිරීම සඳහා රජය විසින් වර්ෂයකට වැය කරනු ලබන මුදල රුපියල්වලින් හා එක්සත් ජනපද ඩොලර්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

833/2023

ගරු නීතිඥ ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා,— කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මැද පෙරදිග රටවල පවත්වා ගෙන යනු ලබන ශ්‍රී ලංකා තානාපති කාර්යාල යටතේ සුරක්ෂා නිවාස පවතින බවත්;

(ii) එම සුරක්ෂා නිවාසවල පවතින ඉඩකඩ ප්‍රමාණවත් නොවන බවත්;

(iii) ඒ හේතුවෙන් ආරක්ෂාව පතා එම නිවාසවලට පැමිණෙන ගෘහ සේවිකාවන් අසරණභාවයට පත්වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් එක් එක් සුරක්ෂා නිවසේ මේ වනවිට රැඳී සිටින ශ්‍රී ලාංකික ගෘහ සේවිකාවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ගෘහ සේවිකාවන් නැවත ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

848/2023

ගරු ගාමිණී වලේබොඩ මහතා,— මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2019 දෙසැම්බර් මාසයේදී එවකට මුදල් අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවක් අනුව සිදු කරන ලද බදු ප්‍රතිසංස්කරණ හේතුවෙන් 2020 වර්ෂයේ සිට ශ්‍රී ලංකාවේ රාජ්‍ය බදු ආදායමට රුපියල් බිලියන 600ක් පමණ වාර්ෂිකව අහිමි වූ බව දන්නේද;

(ii) එම බදු සංශෝධනය හේතුවෙන් රාජ්‍ය ආදායම අඩු වීමෙන් උද්ගත විය හැකි ආර්ථික ප්‍රතිවිපාක පිළිබඳව එම බදු සංශෝධන ඉදිරිපත් කරන ලද නිලධාරීන් විසින් රජයට හෝ අමාත්‍ය මණ්ඩලයට විශේෂඥ වාර්තාවක් ඉදිරිපත් කර තිබුණේද;

(iii) ඉහත බදු සංශෝධන ක්‍රියාත්මක කිරීමෙන් වාර්ෂිකව රජයට අහිමි වේ යැයි ඇස්තමේන්තු කරන ලද බදු ආදායම එක් එක් බදු වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණක්ද;

(iv) එම බදු සංශෝධන හේතුවෙන් රාජ්‍ය බදු ආදායම අඩු වීමෙන් රජයේ ආදායමෙහි සිදු වන අඩුවීම පියවා ගන්නා ආකාරය එම බදු සංශෝධන යෝජනා ඉදිරිපත් කරන ලද නිලධාරීන් විසින් රජයට ලබා දී තිබුණේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1502/2023

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය,— ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට භාවිතා කරනු ලබන බහුදින ධීවර යාත්‍රා සංඛ්‍යාව කොපමණද;

(ii) එම යාත්‍රා අතරින් චන්ද්‍රිකා පහසුකම් සහිත යාත්‍රා සංඛ්‍යාව කොපමණද;

(iii) බහුදින ධීවර යාත්‍රා සඳහා චන්ද්‍රිකා පහසුකම් ලබා දීමේ ව්‍යාපෘතිය මේ වනවිට ක්‍රියාත්මක වන්නේද;

(iv) එසේ නම්, එම ව්‍යාපෘතියේ වර්තමාන ප්‍රගතිය කවරේද;

(v) එම ව්‍යාපෘතියේ වැඩ කටයුතු අවසන් කිරීමට අපේක්ෂිත දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1537/2023

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වී ගොවිතැනේදී හා ගෙවතු වගාවේදී කෘෂි පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරින්ගේ උපරිම දායකත්වය ලබා ගැනීමට පියවර ගෙන තිබේද;

(ii) වල් පැළෑටි මර්දනයේදී සහ පළිබෝධ හා කෘමි උවදුරුවලදී, කෘමිනාශක ද්‍රව්‍ය හා වල්නාශක ද්‍රව්‍ය අලෙවිකරුවන්ගේ උපදෙස් ලබා ගත යුතු තත්ත්වයක් උදා වී ඇති බව දන්නේද;

(iii) එම අලෙවිකරුවන් විසින් අධික මිල ගණන් යටතේ එම ද්‍රව්‍ය අලෙවි කරනු ලබන බව දන්නේද;

(iv) එම තත්ත්වය වැළැක්වීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් නිසි පියවර ගෙන තිබේද;

(v) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2023 මාර්තු 10 සිකුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

859/2023

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොවිඩ්-19 හේතුවෙන් මිය ගිය පුද්ගලයන්ගේ මරණ ආදාහනය කිරීම සම්බන්ධයෙන් වන ප්‍රතිපත්තිමය තීරණය ගැනීමේදී "ප්‍රවීණයින්ගේ කමිටුවක්" විසින් සෞඛ්‍ය අමාත්‍යාංශය නොමඟ යැවීමකට ලක්කර ඇති බවට 2022/11/29 දින දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් සිදු කරන ලද ප්‍රකාශය සමඟ එතුමා එකඟ වන්නේද;

(ii) ඉහත සඳහන් කරන ලද කමිටුව රජය මඟින් පත්කරන ලද කමිටුවක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත කමිටුව රජය මඟින් පත් කරන ලද කමිටුවක් නම් —

(i) එමඟින් කොවිඩ්-19 මරණවල අවසන් කටයුතු සිදු කරන ආකාරය පිළිබඳව විශේෂයෙන් සිදුකරන ලද නිර්දේශ;

(ii) පත්කිරීම් බලධාරියා;

(iii) යොමු කිරීමේ අනුදේශ සහ/හෝ අධිකාරි බලය;

(iv) සාමාජිකයන්ගේ නම් සහ තනතුරු;

(v) සභාපතිවරයාගේ නම;

(vi) එය අඛණ්ඩව රැස් වන්නේද;

(vii) නොඑසේ නම්, එය අවසන් වරට රැස්වූ දිනය;

(viii) මේ දක්වා පවත්වා ඇති රැස්වීම් සංඛ්‍යාව;

(ix) රැස්වීම් පවත්වනු ලබන ස්ථානය;

(x) එකී එක් එක් රැස්වීමේ මුලාසනය දරන ලද තැනැත්තන්ගේ නම් වෙන් වෙන් වශයෙන්;

කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

864/2023

ගරු රෝහණ බංඩාර මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයින්ගේ සමූපකාර සකසුරුවම් සහ ණයදෙන සමිතියේ වර්තමාන පාලනාධිකාරිය විසින් ලොතරැයියක් හඳුන්වාදීමට උත්සාහ කරමින් සිටින බවත්;

(ii) ඒ වෙනුවෙන් එම සමිතියේ සාමාජිකයන්ගේ කැමැත්තකින් තොරව රුපියල් 100ක මුදලක් අයකර ගැනීමට උත්සාහ දරමින් සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) සාමාජිකයන්ට ණය දීමට ඇති මුදල් ලොතරැයියක් සඳහා වෙන් කිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1298/2023

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට රජයේ රෝහල්වල දැඩි ඖෂධ හිඟයක් පවතින බව දන්නේද;

(ii) ඖෂධ මිලදී ගැනීම සඳහා ඉන්දියානු ණය ආධාර ක්‍රමය යටතේ ලැබුණු මුදල කොපමණද;

(iii) එම මුදල් භාවිතා කරමින් ඖෂධ හිඟය මඟහරවා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1303/2023

ගරු කිංස් නෙල්සන් මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ස්ථාපිත කර ඇති මහවැලි කලාප සංඛ්‍යාව කොපමණද;

(ii) එම කලාපවල නම් කවරේද;

(iii) වර්ෂ 2015 සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ ආහාර නිෂ්පාදනය සඳහා මහවැලි කලාපවලින් ලැබුණු දායකත්වය ප්‍රතිශතයක් ලෙස එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත දායකත්වය තවදුරටත් වර්ධනය කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1310/2023

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උමා ඔය විදුලි බලාගාරයෙන් සිදු කරනු ලබන ජල විදුලි බල උත්පාදනය කොපමණද;

(ii) එය ඉදිකිරීම සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iii) එම විදුලි බලාගාරයේ බලාගාර සාධකය කොපමණද;

(iv) ඉහත බලාගාරය, ජාතික විදුලිය පද්ධතියට එක් කිරීමට අපේක්ෂා කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1316/2023

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාවනැල්ල, දෙවනගල රජමහා විහාරයේ පෞරාණිකත්වය වර්ෂවලින් කොපමණද;

(ii) එම විහාරස්ථානයෙන් පුරාවිද්‍යාත්මකව වැදගත් සාක්ෂි හමු වී තිබේද;

(iii) එම සාක්ෂි සංරක්ෂණය කිරීම සඳහා මේ වනවිට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1321/2023

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— වනජීවී හා වනසම්පත් සංරක්ෂණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) මින්නේරිය ජාතික උද්‍යානය හා කවුඩුල්ල ජාතික උද්‍යානය යන උද්‍යානවල සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් "හුරුළු පරිසර වනෝද්‍යාන සංවර්ධන සමිතිය" නමින් සංවිධානයක් පිහිටුවා ඇති බවත්;

(ii) වන සංරක්ෂණ අඥාපනතේ විධිවිධානවලට පටහැනිව එම සංවිධානය ස්ථාපිත කර ඇති බවත්;

(iii) එම සංවිධානය විසින් රුපියල් එක් කෝටි හැත්තෑ ලක්ෂයක් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියට පටහැනි වන ආකාරයට ලබා ගෙන ඇති බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) එම සංවිධානය විසින් සිදු කර ඇති මූල්‍ය අක්‍රමිකතා සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1327/2023

ගරු ඉෂාක් රහුමාන් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) එප්පාවල, සීමාසහිත ලංකා පොස්පේට් සමාගමේ සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව;

(ii) ඒ අතරින් විධායක ශ්‍රේණියේ නිලධාරීන් සංඛ්‍යාව;

(iii) එම නිලධාරීන්ගේ මාසික ප්‍රවාහන දීමනාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එප්පාවල, සීමාසහිත ලංකා පොස්පේට් සමාගම විසින් මාසිකව නිෂ්පාදනය කරනු ලබන පොහොර ටොන් ප්‍රමාණය;

(ii) කිලෝ ග්‍රෑම් 50ක පොහොර මිටියක් නිෂ්පාදනය කිරීම සඳහා වැය වන මුදල;

(iii) පොහොර නිෂ්පාදනයට දායක වන සේවකයන් සංඛ්‍යාව;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත ආයතනය පාඩු ලබන ආයතනයක් බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එම ආයතනය, ලාභ ලබන ආයතනයක් බවට පත්කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1457/2023

ගරු මායාදුන්න චින්තක අමල් මහතා,— තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් ඉලෙක්ට්‍රොනික් හැඳුනුම්පත් සංඛ්‍යාව කොපමණද;

(iii) ශ්‍රී ලංකාවේ සියලුම පුරවැසියන් සඳහා ඉලෙක්ට්‍රොනික් හැඳුනුම්පතක් නිකුත් කිරීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, එම ඉලෙක්ට්‍රොනික් හැඳුනුම්පත නිකුත් කර, අවසන් කිරීමට අපේක්ෂිත කාල වකවානුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1503/2023

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය,— වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) පින්නවල සත්වෝද්‍යානයේ සංවර්ධන කටයුතු මේ වනවිට සිදු කරන්නේද;

(ii) එම සංවර්ධන කටයුතු අවසන් කරනු ලබන දිනය කවරේද;

(iii) දේශීය හා විදේශීය සංචාරකයන්ට එම සත්වෝද්‍යානය නැරඹීම සඳහා අවශ්‍ය මූලික පහසුකම් සකස් කර තිබේද;

(iv) එම සත්වෝද්‍යානයට ඉදිරියේදී සංචාරක ආකර්ෂණය වැඩිකර ගැනීම සඳහා වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

(v) එසේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා. 2/2023

ගරු චමින්ද විජේසිරි මහතා,— රජයේ සියලු ආයතන රජය සතු ගොඩනැගිලිවල ස්ථානගත කිරීම,— මහජනතාවගේ බදු මුදලින් පවත්වාගෙන යනු ලබන රාජ්‍ය ආයතන පෞද්ගලික ගොඩනැගිලිවල ස්ථාපිත කිරීමෙන් විශාල මුදලක් අනවශ්‍ය ලෙස වියදම් වන හෙයින් ද, එම ආයතන, රාජ්‍ය ගොඩනැගිලි තුළ ස්ථාපිත කිරීමෙන් විශාල මුදලක් ඉතිරි කර ගැනීමට හැකි වන හෙයින් ද, සියලුම රාජ්‍ය ආයතන රජය සතු ගොඩනැගිලිවල පමණක් ස්ථාපිත කිරීමට රජය විසින් කටයුතු කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 3/2023

ගරු චමින්ද විජේසිරි මහතා,— කඩා වැටුණු මූල්‍ය ආයතන යළි නඟා සිටුවීම,— රටක ආර්ථික සංවර්ධනය හා මූල්‍ය වෙළඳපොළ කෙරෙහි සුවිශේෂී බලපෑමක් මූල්‍ය ආයතන හරහා සිදුවුවත්, පසුගිය කාලය පුරා මෙරට මූල්‍ය ආයතන කිහිපයක් කඩා වැටීමකට ලක් වී ඇති හෙයින් ද, එහි තැන්පතුකරුවන් පොදුවේ ප්‍රශ්න රාශියකට මුහුණ පා සිටින හෙයින් ද, එම මූල්‍ය ආයතන යළි නඟා සිටුවීම සඳහා කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 4/2023

ගරු චමින්ද විජේසිරි මහතා,— දේශීය ටින්මාළු නිෂ්පාදනය වැඩි කිරීම,— ශ්‍රී ලංකාව වටා මුහුද තිබියදී රටට අවශ්‍ය ටින්මාළු ආනයනය සඳහා වාර්ෂිකව විශාල මුදලක් විදේශ රටවල් කරා ඇදී යන හෙයින්, එම තත්ත්වය වැළැක්වීම සඳහා දේශීය ටින්මාළු කර්මාන්තය දියුණු කිරීමට කඩිනම් වැඩසටහනක් දියත් කිරීමට රජය කටයුතු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 5/2023

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් පාලන ආයතනවල කසළ බැහැර කිරීම,— ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන බොහොමයක් වර්තමානය වනවිට කසළ බැහැර කිරීමේ වගකීම පෞද්ගලික සමාගම් වෙත භාර දීම හේතුවෙන් බදු ගෙවන ජනතාවගේ විශාල මුදලක් අදාළ සමාගම් වෙත විතැන් වන හෙයින් එම කාර්යය අදාළ පළාත් පාලන ආයතනයේ සේවකයන් යොදවා සිදු කිරීමට අවශ්‍ය පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 6/2023

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් පාලන ආයතනවල අබලන් වූ වාහන අලුත්වැඩියා කිරීම,— පළාත් පාලන ආයතන බොහොමයකම අබලන් තත්ත්වයේ පවතින වාහන ගාල් කර ඇති ආකාරය ඉතා සුලභ දසුනක් වන හෙයින් ද, එම ආයතන සඳහා අලුතින් වාහන මිල දී ගැනීම වෙනුවට එම වාහන අලුත්වැඩියා කිරීම තුළින් විශාල මුදලක් ඉතිරි කර ගත හැකි හෙයින් ද, පළාත් පාලන ආයතනවල අබලන් වී ඇති වාහන අලුත්වැඩියා කිරීමට කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 7/2023

ගරු චමින්ද විජේසිරි මහතා,— විදේශගත ශ්‍රමිකයන්ට සුබසාධනය සැලසීම,— ශ්‍රී ලංකාවට වැඩිම විදේශ විනිමය ලබාදීමට උරදෙන විදේශගත ශ්‍රමිකයින්ගේ පවුල්වල සුබසාධනය සඳහා කඩිනම් වැඩසටහනක් දියත් කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 8/2023

ගරු චමින්ද විජේසිරි මහතා,— මී පැණි කර්මාන්තය වැඩිදියුණු කිරීම,— ඉතා ඉහළ ඖෂධීය ගුණයෙන් යුතු, දේශීය හා විදේශීය වෙළෙඳපොළේ ඉහළ ඉල්ලුමක් ඇති මී පැණි කර්මාන්තය, දේශීය වශයෙන් වැඩිදියුණු කිරීමට කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 9/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— රාවණා රජු පිළිබඳ විධිමත් ගවේෂණයක් සිදු කිරීම,— රාවණා රජු පිළිබඳ නිශ්චිත ඉතිහාස තොරතුරු නොමැති වුවද, විධිමත් ගවේෂණයක් තුළින් ඔහු පිළිබඳ අප රටේ ආකල්ප නැංවීමටත්, රාවණා රජු සතුව තිබූ දැනුම රටේ අභිවෘද්ධිය සඳහා යොදා ගැනීමට හා ශ්‍රී ලාංකීය ඉතිහාසයේ සැඟවී ගිය පරිච්ඡේදයක් නිරාවරණය කර ගැනීමටත් හැකි වන බැවින්, විද්වත් කමිටුවක් හරහා රාවණා රජු පිළිබඳ ගවේෂණය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 10/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— දේශීය සහල් වර්ගයන්හි පෝෂ්‍ය ගුණය පිළිබඳ ජනතාව දැනුම්වත් කිරීම,— දැනට ශ්‍රී ලංකාවේ වෙළඳපොළ තුළ දක්නට ලැබෙන පැරණි දේශීය සහල් හා දැනට භාවිත කරන නව සහල් වර්ගයන්ගේ ඇති පෝෂ්‍ය ගුණය පිළිබඳව ද, විවිධ රෝගාබාධ ඇති අය භාවිත කළ යුතු සහල් වර්ග පිළිබඳව ජනතාව දැනුවත් කිරීම මෙන්ම, ගොවි ජනතාවට එම වී වර්ග වගා කිරීමට පහසුකම් සලසාදීම පිළිබඳව ද, රජය විසින් ජාතික මට්ටමේ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 11/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— ආක්‍රමණික පැළෑටි හා සතුන් හේතුවෙන් ජෛව විවිධත්වයට සිදුවන හානිය අවම කිරීම,— ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වයට හානි විය හැකි ආක්‍රමණික පැළෑටි හා සතුන් හඳුනාගෙන, ඒවා නම්කිරීම මඟින් එම පැළෑටි හා සතුන් බෝ කිරීම හා ආනයනය කිරීම තහනම් කර ශ්‍රී ලංකාවේ පරිසරය ආරක්ෂා කිරීමට රජය මැදිහත් වී කඩිනමින් අවශ්‍ය නීති සම්පාදන කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 12/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්වවිද්‍යාල හා වෙනත් තෘතීයික අධ්‍යාපන ආයතනවල ශිෂ්‍ය/ ශිෂ්‍යාවන් විසින් කරනු ලබන පර්යේෂණ නිබන්ධන අදාළ අමාත්‍යාංශවල සංවර්ධන කටයුතු ඉලක්ක කරගනිමින් සකස් කිරීම,— ශ්‍රී ලංකාව තුළ දැනට පවතින විශ්වවිද්‍යාල හා වෙනත් තෘතීයික අධ්‍යාපන ආයතනවල අධ්‍යාපනය ලබන සිසුන් විසින් හදාරනු ලබන පාඨමාලා සම්බන්ධයෙන් සිදු කරනු ලබන පර්යේෂණ නිබන්ධන ශ්‍රී ලංකාවේ ආර්ථික, සමාජීය හා සංස්කෘතික වර්ධනයට අදාළව සිදු කිරීම වැදගත් වන හෙයින් ද, මෙම නිබන්ධන අධීක්ෂණය කරනු ලබන ආචාර්යවරුන් හා එකී පර්යේෂණ නිබන්ධනවලට අදාළ අමාත්‍යාංශය අතර මනා සම්බන්ධීකරණයක් සිදු කිරීම සඳහා එක් එක් අමාත්‍යාංශ මට්ටමින් වගකිව යුතු නිලධාරියකු පත් කළ යුතු හෙයින් ද, අදාළ අමාත්‍යාංශයන් හි ඉදිරි සංවර්ධන ක්‍රියාදාමයන් සිදු කිරීමේ දී දිගුකාලීන, මධ්‍යකාලීන සහ කෙටිකාලීන ඉලක්ක සපුරා ගැනීම සඳහා එකී නිබන්ධන යොදා ගැනීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.13/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— ලොව පුරා ඇති බෞද්ධ සිද්ධස්ථාන රැක ගැනීමට පෙරමුණ ගැනීම,— ලොව පුරා සිටින බෞද්ධයන්ගේ වන්දනාවට පාත්‍රවන බෞද්ධ සිද්ධස්ථානවල ආරක්ෂාව තර කිරීමට හා අන්තර්ජාතික වශයෙන් බෞද්ධයන් වෙනුවෙන් හඬක් නැඟිය හැකි ශක්තිමත් සංවිධානයක් ගොඩනැඟීම සඳහා ලොව පුරා සිටින බෞද්ධ නායකයන් හා සංවිධාන ඒකරාශී කිරීමට ශ්‍රී ලංකාව මූලිකත්වය ගැනීම සඳහා සුදුසු වැඩපිළිවෙළක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 14/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— වැඩිහිටි නඩත්තු මණ්ඩල දිවයින පුරා ව්‍යාප්ත කිරීම,— ජීවිතයේ සැඳෑ සමය ගත කරමින් සිටින වැඩිහිටියන්ට තම පවුලේ සාමාජිකයන්ගෙන් මෙන්ම ඇතැම් ආයතනවලින් නොසලකා හැරීම් නිසා සිදුවන විවිධ අසාධාරණ සම්බන්ධයෙන් පැමිණිලි කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ, වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ මහලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන වැඩිහිටි නඩත්තු මණ්ඩල වැඩපිළිවෙළ පළාත්, දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ව්‍යාප්ත කිරීමට අවශ්‍ය පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 15/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකික ආහාර සංස්කෘතිය පිළිබඳ ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රියාවලියට බද්ධ කිරීම,— ශ්‍රී ලංකාවේ ආහාර කලාව, රසකාරක හා සංයෝග කිරීමේ කලාව, ආහාර පිසීමේ කලාව, වර්ණකාරක කලාව, ආහාර කැපීමේ කලාව ඇතුළු අංශ ගණනාවකින් සමන්විත වන බැවින්, ශ්‍රී ලාංකික ආහාර සංස්කෘතිය පිළිබඳ ඉගෙනුම්, ඉගැන්වීමේ ක්‍රමවේදයන් හරහා අනාගත පරපුරට පවරාදීම මඟින් දේශීය හා විදේශීය ජනතාව අතර අප රටේ ආහාර සංස්කෘතිය ව්‍යාප්ත කිරීමට මෙන්ම ශ්‍රී ලාංකීය අනන්‍යතාවය ලෝකය තුළ ඔසවා තැබීමට සුදුසු වැඩපිළිවෙළක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 16/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— අන්තර්ජාලය ඔස්සේ අළෙවි කිරීම මඟින් සිදු කරන ඖෂධ ජාවාරම මැඩපැවැත්වීම,— වර්තමානය වනවිට අන්තර්ජාලය ඔස්සේ ප්‍රමිතියකින් තොර ඖෂධ, වෛද්‍ය උපකරණ හා රූපලාවණ්‍ය නිෂ්පාදන විශාල ලෙස අළෙවි කරන බැවින් ද, මෙය අප රටේ ජනතාවගේ ජීවිතාරක්ෂාවට විශාල තර්ජනයක් වන බැවින් ද, මෙම තත්ත්වය මැඩපවත්වා ගැනීම සඳහා නිසි වැඩපිළිවෙළක් රජය විසින් සකසා ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 17/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් දරුවන්ගේ වටිනාකම සමාජගත කිරීම,— පාසැල් දරුවන් නිරන්තරයෙන් ඇසුරු කරන දෙමාපියන්, ගුරුවරුන්, ක්‍රීඩා පුහුණුකරුවන්, පාසැල් වෑන් රථ රියැදුරන් ආදී පුද්ගලයන්හට දරුවන්ගේ වටිනාකම පිළිබඳ සමාජ විද්‍යාත්මක හා මනෝවිද්‍යාත්මක ක්‍රමවේද තුළින් සරලව පැහැදිලි කර රටේ හා සමාජයේ ඉදිරි යහපැවැත්ම වෙනුවෙන් දරුවන් සමාජ අභියෝග හමුවේ ආරක්ෂා කළ යුතු ආකාරය පිළිබඳ දැනුම්වත් කිරීමේ ජාතික මට්ටමේ වැඩසටහනක් රජය විසින් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 18/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— ණය ක්‍රමයක් මඟින් වැඩිහිටි ප්‍රජාවගේ ආර්ථිකය ශක්තිමත් කිරීම,— වයස අවුරුදු 60 ඉක්මවා ඇති වැඩිහිටි ප්‍රජාවෙහි ජීවනෝපාය මාර්ග ශක්තිමත් කර දීමෙන් සමස්ත ශ්‍රී ලංකා ආර්ථිකයේ නිෂ්පාදනය වර්ධනය කිරීම සඳහා ඔවුන්ව දායක කර ගත හැකි වන හෙයින් ද, මෙම වැඩිහිටි ප්‍රජාව සඳහා බැංකු පද්ධතිය මඟින් ණය පහසුකම් ලබා නොදීම හේතුවෙන් ඔවුන්ට සමාජය තුළ වෙනස්ව සැලකීමක් සිදුවන හෙයින් ද, බැංකු පද්ධතිය මඟින් වයස අවුරුදු 60 ඉක්මවන්නන් හට ණය දීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම සඳහා යෝග්‍ය වැඩපිළිවෙළක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.